# ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කරගැනීමට ගුරුවරුන් අපේක්ෂා කරන පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය යුතු ආකාරය

නීතිඥ පත්මසිරි කුමාර වනසිංහ[1], මහාචාර්ය ඩබ්.එම්. ශාමින්ද වනසිංහ[2]

## හැඳින්වීම

අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන කොටස්කරුවන් ලෙස ගුරුවරුන් සැමවිටම පිළිගැනෙන අතර එම නිසා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට නම් මෙම ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඉතා වැදගත් වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමෙන් සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ වගකීම මෙම ගුරුවරුන් සතු බැවින් ගුණාත්මක වෘත්තීය සංවර්ධන වැඩසටහන් අවශ්‍ය වේ. ඒ සඳහා පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් යොදා ගත හැකි එක් ක්‍රමවේදයකි. OECD (2005) ඉගැන්වීමේ ගුණාත්මකභාවය ශිෂ්‍ය ඉගෙනීම වෙනස් කිරීමට ඍජුව බලපාන බවට දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිද්ධාන්ත සහ භාවිතය අතර පවතින නොගැලපීම මෙන් ම සිද්ධාන්ත සහ ප්‍රායෝගික භාවිතය අතර ඇති පරතරය සම්බන්ධයෙන් ගැටලුවක් මෙන් ම විවේචනයක් ද පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශය (2012) සඳහන් කර ඇත. එම නිසා ගුරුවරුන්ට විවිධවූත් අර්ථවත්වූත් අධ්‍යාපන අවස්ථා සුලභ කරමින් ගුරුපුහුණුව වඩාත් කාර්යක්ෂම ව සංවිධානය කිරීමේ වගකීම පාසල වෙත පැවරිය යුතු බව යෝජනා කළ අතර පසුව පාසල් පාදක ගුරු සංවර්ධනය පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදි. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා 2013 වර්ෂයේ දී පාසල් පාදක ගුරු සංවර්ධනය හඳුන්වා දෙනු ලැබුවත් නැවතත් 2019 වර්ෂය වන විට පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙමින් පාසල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බවට ප්‍රකාශ කිරීමෙන් ගුරුවෘත්තීය සංවර්ධන වැඩසටහන් ඵලදායිව ක්‍රියාත්මක නොවන බවත් එය ගුරුවරයාගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හේතු වී නොමැති බවත් හෙළි වේ. පාසල්වල ක්‍රියාත්මක වන ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් අපේක්ෂිත ඉලක්ක ඉටු නොවීම ප්‍රශ්නගත වේ. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක නොවීම නිසා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ඵලදායි නොවන්නට ඇත. ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම සඳහා ගුරුවරුන් අපේක්ෂා කරන පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය යුතු ආකාරය අනාවරණය කර ගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

1. පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, පොළොන්නරුව. 51000, ශ්‍රී ලංකාව.
pkwanasinghe@gmail.com
2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව..

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා සාරම්මන නියැදි ක්‍රමය යටතේ උතුරු මැද පළාතේ 1AB, 1C, 2 සහ 3 වර්ගය නියෝජනය වන පරිදි පාසල් 40ක් තෝරා ගනිමින් ගුරුවරුන් 700ක් සරල අහඹු නියැදි ක්‍රමයෙන් තෝරා ගන්නා ලදි. සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් ප්‍රශ්නාවලි මගින් දත්ත රැස් කිරීම සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණය මධ්‍යන්‍ය ඇසුරින් සිදු කරන ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයට අවශ්‍යයැයි ගුරුවරුන් අපේක්ෂා කරන පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් පිළිබඳ ගුරුවරුන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමට ප්‍රකාශ 10ක් ගුරු නියැදියට ලබා දෙන ලදි. ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර වගු අංක 1හි සඳහන් වේ.

වගු අංක 1 වෘත්තීය සංවර්ධනයට අවශ්‍යයැයි ගුරුවරුන් අපේක්ෂා කරන පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ ගුරු ප්‍රතිචාර

| පාසල් වර්ගය | ප්‍රකාශ අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1AB වර්ගය | මධ්‍යන්‍යය | 3.39 | 4.44 | 4.44 | 4.48 | 4.14 | 4.26 | 3.38 | 3.06 | 3.27 | 3.67 |
| | සංඛ්‍යාව | 252 | 252 | 252 | 252 | 252 | 252 | 252 | 252 | 252 | 252 |
| 1C වර්ගය | මධ්‍යන්‍යය | 3.36 | 4.44 | 4.54 | 4.57 | 4.20 | 4.15 | 3.12 | 2.90 | 3.06 | 3.59 |
| | සංඛ්‍යාව | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 |
| 2 වර්ගය | මධ්‍යන්‍යය | 3.47 | 4.74 | 4.67 | 4.53 | 4.46 | 4.00 | 3.40 | 3.21 | 3.06 | 3.53 |
| | සංඛ්‍යාව | 129 | 129 | 129 | 129 | 129 | 129 | 129 | 129 | 129 | 129 |
| 3 වර්ගය | මධ්‍යන්‍යය | 3.19 | 4.37 | 4.54 | 4.64 | 4.28 | 4.00 | 3.29 | 2.63 | 3.17 | 3.37 |
| | සංඛ්‍යාව | 94 | 94 | 94 | 94 | 94 | 94 | 94 | 94 | 94 | 94 |
| සමස්ත ප්‍රතිචාර | මධ්‍යන්‍යය | 3.37 | 4.48 | 4.53 | 4.54 | 4.24 | 4.14 | 3.29 | 2.98 | 3.15 | 3.58 |
| | සංඛ්‍යාව | 700 | 700 | 700 | 700 | 700 | 700 | 700 | 700 | 700 | 700 |

< 1.80 - කිසිසෙත් සුදුසු නොවේ. 1.81-2.60 - සුදුසු නොවේ. 2.61-3.40 - තරමක් සුදුසු වේ. 3.41-4.20 - සුදුසු වේ. > 4.21 ඉතා සුදුසු වේ.

ප්‍රශ්නාවලියේ පළමු ප්‍රකාශයෙන් පාසලේ සිටින ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් මගින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරන්නේදැයි ගුරුවරුන්ගේ අදහස් විමසන ලදි. ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේ දී ($\bar{x} = 3.37$) පාසලේ සිටින ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් මගින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තරමක් සුදුසු බවට තහවුරු කරන ලදි. ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව

විශ්ලේෂණය කිරීමේ දී 1AB වර්ගය ($\bar{x}$=3.39), 1C වර්ගය ($\bar{x}$=3.36) සහ 3 වර්ගයේ ($\bar{x}$=3.19) පාසල්හි ගුරුවරුන් පාසලේ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් මගින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තරමක් සුදුසු බවට ප්‍රතිචාර දක්වන විට 2 වර්ගයේ පාසල්හි ගුරුවරුන් ($\bar{x}$=3.47) පාසලේ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් මගින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ප්‍රතිචාර දක්වන ලදි.

ගුරු නියැදියට ලබා දුන් ප්‍රශ්නාවලියේ දෙවන ප්‍රකාශයෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා විශේෂඥයින් සම්බන්ධ වීම ගුරුවරුන් අපේක්ෂා කරන්නේදැයි විමසා සිටින ලදි. නියැදියේ සියලු දෙනාම වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ දී විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම අපේක්ෂා කරන බව ($\bar{x}$=4.48) අනාවරණය විය. පාසල් වර්ග අනුව ගුරු ප්‍රතිචාර විශ්ලේෂණය කිරිමේ දී 1AB ($\bar{x}$=4.44), 1C ($\bar{x}$=4.44), 2 ($\bar{x}$=4.74) සහ 3 වර්ගයේ පාසල්හි ගුරුවරුන් ($\bar{x}$=4.37) විශේෂඥයින් සම්බන්ධ වී ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු බවට පිළිගෙන ඇත. විෂය සම්බන්ධ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් අපේක්ෂා කරන්නේදැයි තෙවන ප්‍රකාශයෙන් විමසූ විට වඩාත් සුදුසු බවට ($\bar{x}$=4.53) එකඟ වන ලදි. ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී පාසල් වර්ග හතරේම (1AB වර්ගය $\bar{x}$=4.44, 1C වර්ගය $\bar{x}$=4.54, 3 වර්ගය $\bar{x}$=4.45, 2 වර්ගය $\bar{x}$=4.67) ගුරුවරුන් විෂය සම්බන්ධ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු බවට පිළිගන්නා ලදි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම සහ ඵලදායි කර ගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ අවබෝධය ගුරුවරුන්ට අත්‍යවශ්‍ය වන නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඉතා සුදුසු බවට ගුරුවරුන් පිළිගන්නා බව දත්ත විශ්ලේෂණයෙන් ($\bar{x}$=4.54) අනාවරණය විය. ගුරු ප්‍රතිචාර පාසල් වර්ග අනුව විශ්ලේෂණයේ දී ප්‍රතිචාරයන්හි වෙනසක් නොමැති බව (1AB වර්ගය $\bar{x}$=4.48, 1C වර්ගය $\bar{x}$=4.57, 2 වර්ගය $\bar{x}$=4.53, 3 වර්ගය $\bar{x}$=4.64) පාසල් අනුව වර්ග කිරීමේ දී අනාවරණය විය. ගුරුවරුන් ද සමාජශීලී සත්වයින් නිසා රංචු ලැදියාවෙන් යුක්ත වේ. වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහයෝගී ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතා සුදුසු බවට ($\bar{x}$=4.24* ගුරු නියැදිය ප්‍රතිචාර දක්වන ලදි. ගුරු නියැදියේ ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 1AB වර්ගයේ ($\bar{x}$=4.14) සහ 1C වර්ගයේ ($\bar{x}$=4.20) පාසල්හි ගුරුවරුන් සුදුසු බවට යෝජනා කරන විට 2 වර්ගයේ ($\bar{x}$=4.46) සහ 3 වර්ගයේ ($\bar{x}$=4.28) පාසල්හි ගුරුවරුන් ඉතා සුදුසු බවට පිළිගන්නා ලදි.

ගුරුවරුන් නව ඇගයීම් ක්‍රමවේද පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ($\bar{x}$=4.14) පිළිගන්නා ලදි. ගුරු ප්‍රතිචාර පාසල් වර්ග අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගය ($\bar{x}$=4.00), 2 වර්ගය ($\bar{x}$=4.00) සහ 1C වර්ගයේ ($\bar{x}$=4.15) පාසල්හි ගුරුවරුන් නව ඇගයීම් ක්‍රමවේද ඇතුළත් වෘත්තීය සංවර්ධන වැඩසටහන් සුදුසු බවට පිළිගන්නා විට 1AB වර්ගයේ පාසල්හි ගුරුවරුන් වඩාත් සුදුසු බවට ($\bar{x}$=4.26) පිළිගන්නා ලදි. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය වඩාත් සිදු වනුයේ පාසල් පාදකව ද එසේත් නොමැති නම් පාසලෙන් පරිබාහිරව ද යන්න අනාවරණය කර ගැනීමට පාසල් පාදක වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට වඩා බාහිර ආයතන මගින් මෙහෙයවන වෘත්තීය සංවර්ධන වැඩසටහන් වඩාත් සුදුසු බවට ප්‍රකාශයක් ලබා

දෙන ලදි. නියැදියේ ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේ දී පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට වඩා බාහිර ආයතන මගින් පවත්වන වෘත්තීය සංවර්ධන වැඩසටහන් තරමක් ඵලදායි බවට ($\bar{x}$=3.29) පිළිගන්නා ලදි. ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව වෙනසක් දක්නට නොලැබුණත් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට වඩා බාහිර ආයතන මගින් පවත්වන වැඩසටහන් ඵලදායි බවට ගුරුවරුන් පිළිගන්නා ලදි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කරන කාලයේ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වේ. එම නිසා පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් පාසල් නිවාඩු කාලයේ පැවැත්වීම සුදුසුදැයි විමසූ විට තරමක් සුදුසු බවට ($\bar{x}$=2.98) ප්‍රතිචාර අනුව අනාවරණය විය. ගුරු නියැදියේ ප්‍රතිචාර පාසල් වර්ග අනුව විශ්ලේෂණය කිරීමේ දී ප්‍රතිචාර සම්බන්ධයෙන් වෙනසක් නොමැති බවට තහවුරු විය. ගුරු වෘත්තීය සංවර්ධනය අඛණ්ඩව සිදු විය යුතු වේ. එම නිසා සෑම වාරාවසාන නිවාඩුවක දීම වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට ගුරුවරුන් අපේක්‍ෂා කරන්නේදැයි අනාවරණය කර ගැනීමට ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදි. ගුරු නියැදියෙන් ලැබුණු ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේ දී ලැබුණු මධ්‍යන්‍ය අගය ($\bar{x}$=3.15) අනුව ගුරුවරුන් සෑම වාරාවසානයක දීම වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම තරමක් සුදුසු බවට පිළිගන්නා ලදි.

කෙටිකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය කරගැනීමට අපේක්‍ෂා කරන්නේදැයි අනාවරණය කර ගැනීමට ප්‍රකාශයක් ලබා දෙන ලදි. ගුරු නියැදියේ ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේ දී කෙටිකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය කරගැනීම ($\bar{x}$=3.58) සුදුසු බවට පිළිගන්නා ලදි. පාසල් වර්ග අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගයේ පාසල්හි ගුරුවරුන් ($\bar{x}$=3.37) කෙටිකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තරමක් සුදුසු බවට මධ්‍යස්ථ ප්‍රතිචාර දක්වනු ලැබුවත් 1AB වර්ගය ($\bar{x}$=3.67), 1C වර්ගය ($\bar{x}$=3.59) සහ 2 වර්ගය ($\bar{x}$=3.53) පාසල්හි ගුරුවරුන් එය සුදුසු බව පිළිගන්නා ලදි.

**නිගමනය**

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම, විෂය සම්බන්ධ වැඩසටහන්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ වැඩසටහන්, සහයෝගී ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් වැඩසටහන්, ඇගයීම් ක්‍රමවේද පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන්, කෙටිකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු බවට නිගමනය කළ හැකි ය. වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගුරුවරුන්ගේ අවශ්‍යතා විමසා සැලසුම් කිරීම වඩාත් සුදුසු බවට යෝජනා කෙරේ.

**මුඛ්‍ය පදඃ** ඉගැන්වීමේ ගුණාත්මකභාවය, ගුරුවරු, පාසල් පාදක ගුරුවෘත්තීය සංවර්ධන වැඩසටහන්, වෘත්තීය සංවර්ධනය

## ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය, (2013). *පාසල් පාදක ගුරු සංවර්ධනය මාර්ගෝපදේශ අත්පොත*. ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන අමාත්‍යාංශය, (2019). *පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධනය උපදෙස් සංග්‍රහය*. ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශය.

Organization for Economic Co-operation and Development (OECD). (2005). Teachers Matter: Attracting. Developing and Retaining Effective Teachers. France, OECD Publications.